# ජනාධිපති කාර්යාලය
# ஜனாதிபதி அலுவலகம்
# PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය : SP/SB/07/15

මගේ අංකය : SB/02/01/චක්‍රලේඛ

2015 සැප්තැම්බර් මස 25 වන දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

**රාජ්‍ය අංශයේ උත්සව, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම**

වර්තමානයේ රාජ්‍ය ආයතන විසින් උත්සව, සම්මන්ත්‍රණ හා වැඩමුළු ආදිය අධික පිරිවැයක් දරමින් ඉහළ පන්තියේ සුපිරි ගණයේ හෝටල්වල පැවැත්වීම නිතිපතා සිදුවන ක්‍රියාවලියක් බවට පත් කරගෙන ඇත. විශේෂයෙන් විදේශාධාර/ණය මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති වෙනුවෙන් ඉහත සඳහන් ආකාරයේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සුලභව දක්නට ලැබෙන අතර, එම ණය/ආධාර මෙරටට පිරිනමනු ලබන්නේ රටේ සංවර්ධන කාර්යයට දායකත්වය සැපයීමට මිස ඉහත සඳහන් කළ ආකාරයේ අධික පිරිවැයක් සහිත වැඩසටහන් සඳහා යෙදවීමට නොවන බව අවධාරණය කරමි.

රාජ්‍ය ආයතනවලට පැවැත්වීමට අත්‍යාවශ්‍ය ස්වභාවය වැඩසටහන් සඳහා අපේක්ෂිත පරමාර්ථ ළඟාකරගත හැකිවන පරිදි අවම පිරිවැයක් යටතේ සංවිධානය කිරීමට හැකි සුදුසු හෝටල් සහ සම්මන්ත්‍රණ ශාලා සෑම දිස්ත්‍රික්කයක් තුළම ඇති බැවින්, එවැනි පහසුකම් සලසා ගැනීමට පියවර ගන්නා ලෙස උපදෙස් දෙමි. එමෙන්ම, මේ සඳහා රජය මඟින් පහසුකම් සලසා ඇති ආයතනද යොදා ගැනීමට හැකිවේ. (උදා - කොළඹ දිස්ත්‍රික්කය තුළ පවත්වන සම්මන්ත්‍රණ සඳහා ශ්‍රී ලංකා පමුණුනි කාර්යාංශය, ශ්‍රී ලංකා පදනම් ආයතනය, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, සිරිමාවෝ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව)

ඒ අනුව, ඉහත කරුණු පිළිබඳව ඔබගේ පුද්ගලික අවධානය යොමු කරමින් ඉදිරියේදී පැවැත්වීමට අපේක්ෂිත රාජ්‍ය අංශයේ උත්සව, සම්මන්ත්‍රණ, වැඩමුළු හා අනෙකුත් එවැනි වැඩසටහන් අවම පිරිවැයක් යටතේ ඉහළ ප්‍රතිලාභ ළඟාකරගත හැකිවන අයුරින් සංවිධානය කිරීමට ඔබ අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනවලට උපදෙස් ලබාදීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

පී බී අබේකෝන්
ජනාධිපති ලේකම්

(මෙම චක්‍රලේඛයේ දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තන මේ සමඟ අමුණා ඇත.)

Galle Face, Colombo 01 | Telephones | Fax | E-mail ...presidentsoffice.lk